අධ්‍යාපන අමාත්‍යාංශයේ ආගම් හා සාරධර්ම
ඒකකයේ ඉදිරිපත් කිරීමකි.

12 ශ්‍රේණිය

බෞද්ධ දේශපාලන මූලධර්ම අතරින් දසරාජ
ධර්ම හඳුනාගැනීම.

සැකසුම

ශාස්ත්‍රවේදී මොරටු මහා විද්‍යාලයේ ධර්මාචාර්ය
පුජ්‍ය කුඹුක්ගොල්ලෑවේ සුමනසාර හිමි.

www.mahamevnawa.lk

දැහැමි රාජ්‍ය පාලනයක් සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ දේශපාලන ඉගැන්වීම් අතරින් වැදගත් වූ ඉගැන්වීමක් ලෙස දසරාජ ධර්ම හඳුන්වා දී තිබේ.

ජාතක පාලියේ අන්තර්ගත දසරාජ ධර්ම මේසේ ය.

දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං
අක්කෝධං අවිහිංසඤ්ච ඛන්තිඤ්ච අවිරෝධනං



1 දානය

2 සීලය

3 පරිත්‍යාගය

4 ඍජුබව

5 මෘදුබව

6 තපස

7 අක්‍රෝධය

8 අවිහිංසාව

9 ඉවසීම

10 අවිරෝධතාව

# දසරාජ ධර්මවල
# දානය




- බුදුදහමට අනුව දානය නිවනට මූලික පියවරක් වේ.
- ආමිස දාන, ප්‍රතිපත්ති දාන, අභය දාන, ධර්ම දාන වශයෙන් බුදුදහම තුළ සඳහන්ව ඇත.
- රජුට මේ ඕනෑම දානයක් කිරීම අපහසු නොවේ.
- දසරාජ ධර්මවල දානය යනු - භාණ්ඩාගාරයේ මුදල් සැලසුම් සහගතව රටේ සමෘද්ධිය වෙනුවෙන් ලබාදීම ලෙස දැක්වේ.
- රටවැසියාගේ ආර්ථික සමෘද්ධිය සඳහා අවශ්‍ය ප්‍රාග් ධනය ලබා දීම වේ.
- කූටදන්ත සුත්‍රයේ සඳහන් පරිදි රටේ කෘෂිකර්මාන්තය, ගව පාලනය ආදී වෘත්තීන්හි නියැලෙන්නන්ට ධාන්‍ය, බීජ ,ආහාරපාන හා කෘෂි උපකරණ ලබා දීම වේ.
- රටේ සිටින විවිධ වෘතිතයින් හට ඔවුන්ගේ කටයුතු කර ගෙන යාමට රජු විසින් සහාය ලබා දීම මෙහි අරමුණ වේ.
- පොදුවේ ගත් කල දානය යනු රජු විසින් ප්‍රජා සුභසාධනය කිරීම හා ප්‍රජා අවශ්‍යතා සපුරා ලීම වේ එය සාර්ථකව රජය තුළ සිදු වන්නේ නම් රටතුළ සංවර්ධනයක් මෙන්ම යහපාලනයක් ද දැකිය හැ වේ.

# දසරාජ ධර්මවල
# සීලය



**සීලය යනු-**
ප්‍රතිපත්ති ගරුක බව.
රජු සදාචාර සම්පන්න ව ක්‍රියා කළ යුතු බව.

**කාය වාචානං සමෝධානං සීලං-** පාලකයා කය හා වචනය සංවරව හැසිරිය යුතුය සාමාන්‍ය ජනයාට වඩා රජු ශිෂ්ටසම්පන්න විය යුතුය.

පාලකයා පඤ්චසීලය ආරක්ෂා කළයුතු අතර එවිට ජනතාවගේ ජීවිත ද ආරක්ෂා වේ.

පාලකයා මිනිසුන්ගේ මෙන්ම මෑඝ පන්ෂීන්ගේ ද ජිවිත ආරක්ෂා කළ යුතු ය.

- පාලකයා සියලු සත්වයන්ගේම ආරක්ෂකයා බැවින් එසේ කළ යුතුය.
- සීලයෙන් යුක්ත පාලකයා ජනතාවගේ දේපලද ආරක්ෂා කළ යුතුය.
- පාලකයෝ යහපත් විවාහයන් විනාශ කර තමන්ගේ අභිමත ඉටු කර ගනිති, එවැනි කටයුතු සීලයෙන් යුක්ත පාලකයාගෙන් ජනතාව අපේක්ෂා නොකරයි.
- එසේම සීලයෙන් යුක්ත වු විට පාලකයෝ එවැන්නක් සිදු නොකරයි.

# සීලය

සීලයෙන් යුතු පාලකයා බොරු නොකියයි බොරු පොරොන්දු දී ජනතාව මුළා නොකරයි සත්‍ය වචනම කතා කරයි

මත්වතුර පානය නොකරන්නේ පාලකයා සීලයෙන් යුක්ත නම් පමණි. එසේ වූ විට ජනතාවගේ ද කායික හා මානසික නිරෝගිතාව පිළිබඳව සැළකීමක් කරයි.

පංචසීලයෙන් යුක්තව කටයුතු කරන පාලකයාගෙන් ජනතාවට ඉමහත් සේවයක් සිදු වේ

එවැනි පාලකයින් සිටින රාජ්‍යයන් ධාර්මික රාජ්‍ය බවට පත් වේ.

# දසරාජ ධර්ම වල පරිත්‍යාගය



- මහජනයා වෙනුවෙන්
- කාලය, ශ්‍රමය හා භෞතික සම්පත් කැප කිරීම.
- සිය ජීවිතයම ජනතාව වෙනුවෙන් කැප කිරීම පාලකයා සතු පරිත්‍යාගය වේ.
- අශෝක රජුගේ හයවන ගිරි ලිපියේ මෙයට උදාහරණයක් දක්වා ඇත.
- රජු අන්තඃපුරයෙහි, නිදනගෙයි සිටිනවිට, හෝ ආහාර ගැනීමෙහි, හෝ අසුන් පිට යෑමෙහි, හෝ යෙදී සිටින විට ජනතාවගේ කටයුතු රජතුමාට දන්වන්නයැයි දන්වා ඇත.

# දසරාජ ධර්ම වල සෘජු බව



- රජු අගතිගාමී නොවී අවංකවම සේවය කිරීම.
- ගන්නා ලද තීරණ රටෙත් ජනතාවගෙත් අභිවෘද්ධිය වෙනුවෙන් ගැනීම කළ යුතුය.
- විවිධ ගැටලුවලට විසඳුම් සෙවීමේ දී හිතවත්කම් මත එය වෙනස් නොවන ආකාරයෙන් එම තීරණ ගත යුතුය.
- විවිධ වාසි ප්‍රයෝජන සඳහා පාලකයෝ තම තීන්දු තීරණ වෙනස් කරන්නේ නම් එය සෘජු බවට පටහැණිය.
- ස්ථිරසාර තීරණ නොමැති පාලකයා අස්ථාවරත්වයට ලක් වේ.
- අයුක්තිය අසාධාරණය පුටු දැක යුක්තිය සාධාරණත්වයට ගරු කරණ අයෙකු තුළ සෘජු බව දක්නට ඇත.
- කියන දේ කරන කරණ දේ කියන පාලකයා සෘජු බවින් යුක්ත වේ.

# දසරාජ ධර්ම වල මෘදු බව



- පාලකයා ජනතාවගේ දුක් පිඩාවන් කෙරෙහි සංවේදී විය යුතුය.
- පාලකයා ගන්නා ලද තීන්දු තීරණ දැඩි විය යුතු වගේම ඒවා ජනතාවගේ විරෝධයක් වගේම ජනතාව පීඩාවට පත්වන ආකාරයෙන් ක්‍රියාත්මක නොකිරීමට ද කටයුතු කළ යුත වේ.
- ජනතාව යම් නීතිරීතියකට විරුද්ද වේ නම් ඔවුන්ගේ බසට ඇහුන්කන් දී එය වෙනස් කිරීමට හෝ සංශෝදනය කිරීමට රජු නම්‍යශීලි වීම මෘදු බව වේ.
- බුදුරජාණන් වහන්සේ ද භික්ෂුන් වෙනුවෙන් පනවන ලද විනය නීති වෙනස් කිරීමට යම් අවස්ථාවන් වල තීරණය කරන්නට යෙදුනේ එම හේතුව නිසාය.
- කාන්තා පැවිද්ද උදාහරණයක් සේ ගත හැකි ය
- දෙමාපියන් දරුවන් කෙරෙහි දක්වන ලද සෙනෙහසක් පාලකයාට රට වැසියන් කෙරෙහි දක්වන්නට හැකි නම් පාලක හා පාලිත යන දෙපිරිස අතර බැඳීම් වැඩි වේ.

# දසරාජ ධර්ම වල තපස

- ඉන්ද්‍රය දමය පවිටු සිතිවිලිවලට වහල් නොවීම තපස වේ.
- පාලකයා පසිදුරන් පිනවීමට ගිජු නො වී ක්‍රියා කිරීම තපස වේ.
- සාමාන්‍ය ජනයාට නැති බලයක් පාලකයාට හිමි වේ. ඒ තුළින් සමහර පාලකයින් තම පසිඳුරන් පිනවිමට ගොස් රට පරිහාණියට පත් කරයි. පාලකයා එසේ කිරීම තුළ ජනතාව නිවැරදි මගට යොමු කළ නොහැකිය.
- පසිඳුරන් පිනවීමට යන පාලකයින්ගෙන් රටට සමාජයට කිසිදු මෙහෙයක් ඉටු නොවේ.
- එවිට අභ්‍යන්තර ප්‍රශ්න ඇති වේ.
- එවැනි තත්ත්වයක් ඇති නොවීමට නම් පාලකයා ඉන්ද්‍රිය දමනයෙන් පඤ්චකාම වස්තූන්ට ගිජු නොවී කටයුතු කළ යුතුය.



# දසරාජ ධර්මවල අක්‍රෝධය



- ප්‍රජාව කෙරෙහි ක්‍රෝධයෙන් තොරව මෛත්‍රියෙන් කටයුතු කිරීම අක්‍රෝධය වේ.
- පාලකයාට විවිධ ප්‍රශ්න ඇති වේ, එම ප්‍රශ්න විසදීමේ දී පාලකයා මෛත්‍රී සහගත විය යුතුය.
- ක්‍රෝධයෙන් කිසිවක් විසදිය නොහැකිය, අක්‍රෝධයෙන් සියල්ල විසදිය හැකිය.
- අක්කෝධේන ජිනේ කෝධං යන පාඨයෙන් එය කිය වේ.
- මව හා පියා තමන්නේ දරුවන් දිවිහිමියෙන් රකින්නාසේ රටේ පාලකයා ජනතාව කෙරෙහි මෛත්‍රිය දැක් විය යුතුය, එවිට රටක සමාජයක අභිවෘද්ධිය නිතැතින්ම සැලසේ.
- ක්‍රෝධයෙන් පෙළෙන පාලකයාට යහපත් තීන්දු තීරණවලට එළඹිය නොහැකිය.
- ක්‍රෝධයෙන් පෙළෙන පාලකයින් සිටින සමාජයට රටට සිදුවන්නේ අගතියක් පමණි.
- ක්‍රෝධයෙන් තොරව මෛත්‍රියෙන් කටයුතු කිරීම තුළින් පාලකයාට මෙන්ම ඔවුන් කටයුතු කරන රටට යහපතක් වේ, එම නිසා පාලකයා අක්ක්‍රෝධයෙන් යුක්ත විය යුතුය.

# දසරාජ ධර්මවල අවිහිංසාව

- මහජනයාට හිංසා පීඩා නොකිරීම අවිහිංසාව වේ.
- හිංසාවෙන් තොරවීම.
- සෑම සත්වයෙක්ම හිංසාවට දඬුවමට අකමැතිය, සුඛ කාමානි භූතානි යෝ දණ්ඩේන විහිංසති.
- අතීතයේ පාලකයෝ බොහෝ දෙනෙක් මෙම ඉගැන්වීමට අනුව ක්‍රියා කර ඇත.
- කොසොල් රජු බුදුන්වහන්සේගේ උපදෙස් මත යාගයට සුදානම් කර සිටිය සතුන් නිදස් කිරීම.
- අශෝක රජු බෞද්ධයෙක් වු පසු යුද්ධය අතහැරීම.
- ලාංකික රජ කෙනෙකුවන ආමණ්ඩගාමී අභය රජු මාඝාත ආඥාව පැනවීම යන කරුණුවලින් එය සනාථ වේ.
- ඒ අනුව පාලකයාද අවිහිංසාවෙන් කටයුතු කළ යුතුය ජනතාව තලාපෙළා අයබදු එකතු නොකළ යුතුය, ඔවුන්ට කායික හෝ මනිසික පීඩාවන් නොදිය යුතු යි
- එය අවිහිංසාව වේ.

# දසරාජ ධර්මවල ඉවසීම



- විරුද්ධ අදහස් මතවාද හා ක්‍රියාකාරකම් කෙරෙහි ඉවසීමෙන් කටයුතු කිරීම වේ.
- රාජ්‍ය පාලකයින් සඳහා වෙන් වු මෙය රටේ සිටින ඕනෑම අයෙක් සඳහා වැදගත් වු ඉගැන්වීමක් වේ.
- රජුට එල්ලවන අභියෝග ගැටලු අපමණ වේ ඒ සෑම දේකටම සාර්ථකව මුහුණ දීමට ඉවසීම අවශ්‍ය වේ.
- ඉවසිම නැති කරන ඉගැන්වීම් ද ඇත,ඒවා අතර ධනය, බලය ප්‍රධාන වේ.
- ඉවසීමෙන් තොරව ගන්නා ලද තීරණ රජයට මෙන්ම ජනතාවටත් හානි විය හැකිය.
- දීඝිති කෝසල ජාතකය උදාහරණයක් සේ ගත හැකිය ළග නොබලන්න දුර බලන්න යන ප්‍රකාශනයෙන් ද ඉවසීම ගැන කිය වේ.
- අටලෝ දහමින් කම්පා නොවී සිටීම ද ඉවසීම වේ.
- එම නිසා සෑම පාලකයෙක්ම ඉවසීමෙන් යුතුව කටයුතු කළ යුතු බව මෙයින් අවදාරණය කෙරේ.

# දසරාජ ධර්මවල අවිරෝධතාව

- මහජනයා සමගත් විදේශ රජුන් සමගත් නො ගැටී සහයෝගයෙන් ක්‍රියා කිරීම අවිරෝධතාවය වේ.

- පාලකයාට සමාන අදහස් දරන්නන් සමඟද, විරුද්ධ අදහස් දරන්ණන් සමඟද, කටයුතු කිරීමට සිදු වේ, එවිට සියලු දෙනාගේ අදහස් වලට විරුද්ධ නොවිය යුතුය. සියල්ල ඇසිය යුතුය. අත්තනෝමතිකව ක්‍රියා නොකළ යුතුය.

- මෙම ක්‍රියාවන් කඩ නොකල හොත් ජනතාව රජුට විරුද්ධ නොවේ.

- එම නිසා සියලු දෙනා මර්ධනය කිරීමට කටයුතු නොකර සුභවාදී අදහස් ඉදිරිපත් කොට ඒ මත කටයුතු කිරීමට ක්‍රියා කළ යුතුය.

- තමා වෙත එල්ලවන සියලු විරෝධතාවයන් ඉවසීමෙන් ලබා ගෙන ඒවාට සුභවාදීව කටයුතු කිරීම අවිරෝධතාවය වේ.

# ක්‍රියාකාරකම් 01



01. දසරාජ ධර්ම පිළිවෙලින් නම් කරන්න.
02. දැහැමි රාජ්‍ය පාලනයකට එය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.